(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 36.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2020 දෙසැම්බර් 01 අඟහරුවාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

49/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල් අතරින් දැනට උසස් පෙළ තාක්ෂණික විෂය ධාරාව හැදෑරීමේ පහසුකම් ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

(v) උසස් පෙළ තාක්ෂණික විෂයධාරාව හැදෑරීමේ පහසුකම් තවදුරටත් බදුල්ල දිස්ත්‍රික්කය තුළ පුළුල් කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

149/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළොන්නාව අධ්‍යාපන කොට්ඨාසයේ පිහිටි එකම මිශ්‍ර ජාතික පාසල වන කුඩාබුත්ගමුව ශ්‍රී රාජසිංහ විද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ඉතිහාසය, පුරවැසි අධ්‍යාපනය, නාට්‍ය හා රංග කලාව යන විෂයයන් සඳහා ගුරු පුරප්පාඩු 02 බැගින්ද, දෙමළ භාෂාව, චිත්‍ර කලාව, තොරතුරු තාක්ෂණය, මාධ්‍ය, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව, ජෛව පද්ධති තාක්ෂණ විද්‍යාව, ගිණුම්කරණය, සන්නිවේදන හා මාධ්‍ය, බෞද්ධ ශිෂ්ටාචාරය යන විෂයයන් සඳහා ගුරු පුරප්පාඩු 01 බැගින්ද, ශිෂ්‍ය උපදේශනය, ගුරු පුස්තකාල තනතුරුවල පුරප්පාඩු 01 බැගින් ද පවතින බවත්;

(ii) අනධ්‍යයන කාර්ය මණ්ඩලය තුළද සනීපාරක්ෂක කම්කරු, උද්‍යාන කම්කරු සහ සාමාන්‍ය කම්කරු තනතුරුවල පුරප්පාඩු 02 බැගින්ද, විද්‍යාගාර සහායක තනතුරේ පුරප්පාඩු 03 ක් ද, කළමණාකරණ සහකාර තනතුරේ පුරප්පාඩු 01ක් ද පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා අමාත්‍යාංශයට ඇති සැලසුම් සහ එම පුරප්පාඩු පුරවන ලබන නිශ්චිත දින වකවානු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

190/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකාවේ ඇති ක්‍රිකට් සංගම් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ඇති පරිපාලන දිස්ත්‍රික්ක 25 සඳහා ක්‍රිකට් සංගම් 25ක් තිබෙන බවත්;

(ii) කිළිනොච්චි දිස්ත්‍රික්කය සඳහා වූ ක්‍රිකට් සංගමය පිහිටුවීමට මෙතෙක් අනුමතිය ලබා දී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) කිළිනොච්චි දිස්ත්‍රික්කය සඳහා වූ ක්‍රිකට් සංගමය පිහිටුවීමට මෙතෙක් අනුමතිය ලබා නොදීමට;

(ii) තම ලියාපදිංචිය ඉල්ලා කිළිනොච්චි දිස්ත්‍රික් ක්‍රිකට් සංගමය අවස්ථා ගණනාවකදීම අයදුම් කර ඇතත් මෙතෙක් ලියාපදිංචි නොකිරීමට;

හේතු කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) 2010 වර්ෂයෙන් පසුව කිළිනොච්චි දිස්ත්‍රික් ක්‍රිකට් සංගමය සඳහා ක්‍රීඩා අමාත්‍යාංශය විසින් ලබාදී ඇති ආධාර කවරේද යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

204/2020

ගරු මුජිබුර් රහුමාන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (3)

(අ) (i) හෘදය සැත්කම් සිදු කර ගැනීම සඳහා රෝගීන් දහස් ගණනක් වසර ගණනාවක් තිස්සේ රජයේ රෝහල්වල පොරොත්තු ලේඛනයේ සිටින බවත්;

(ii) ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි පෞද්ගලික රෝහල්වලින් එම සැත්කම් සිදු කර ගැනීම සඳහා රුපියල් මිලියන ගණනක් දැරීමට සිදු වන බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) එසේ නම්,

(i) පසු ගිය වසර පහක කාලය තුළදී ශ්‍රී ලංකාවෙන් වාර්තා වූ හෘද ආශ්‍රිත රෝග සංඛ්‍යාව කොපමණද;

(ii) හෘදය සැත්කම් සිදු කර ගැනීම සඳහා පසු ගිය වසර පහක කාලය තුළදී රජයේ රෝහල්වල ලියාපදිංචි වී ඇති රෝගීන් සංඛ්‍යාව කොපමණද; සහ

(iii) එසේ ලියාපදිංචි වූ රෝගීන් සඳහා පසු ගිය වසර පහ තුළදී වාර්ෂිකව සිදු කරන ලද සැත්කම් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වර්තමානයේදී අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තිය පිළිබඳව රජය සෑහීමකට පත්වන්නේද; සහ

(ii) දැනට පවත්නා මෙම තත්ත්වය වැඩිදියුණු කර ගැනීම පිණිස ඒ සම්බන්ධයෙන් සිදු කර ඇති ප්‍රධාන නිරීක්ෂණ සහ නිර්දේශ කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

303/2020

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන සඳහා වූ රාජ්‍ය අමාත්‍යාංශයක් පිහිටුවා ඇති පසුබිමක —

(i) ශ්‍රී ලංකාව තුළ බහු විවෘත විශ්වවිද්‍යාල ආරම්භ කිරීමට රජය අරමුණු කර තිබේද;

(ii) රජය විසින් දුරස්ථ ඉගෙනුම් අවස්ථා පුළුල් කිරීමට අදහස් කරන්නේ, උසස් අධ්‍යාපනය ලැබීමට බලාපොරොත්තු වන කවර කණ්ඩායම් ඉලක්ක කරගෙනද;

(iii) දුරස්ථ අධ්‍යාපන අවස්ථා සඳහා සහනාධාර ලබා දීමට ඉදිරියේදීත් රජය පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා එහි අරමුදල් යටතේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය තවදුරටත් ක්‍රියාත්මක වන්නේද;

(ii) නොඑසේ නම්, එය පාලනයට නතු කරනු ලබන අධිකාරිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?;

(ඇ) (i) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කටයුතු සඳහා වෙන් කර ඇති අරමුදල් ප්‍රමාණය කොපමණද;

(ii) විශ්ව විද්‍යාලය සඳහා දරනු ලබන වියදමින් රජය විසින් දරනු ලබන ප්‍රමාණය කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

428/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ දෛනික විදුලි පරිභෝජනය දළ වශයෙන්;

(ii) මේ සඳහා වන විදුලිය අවශ්‍යතාවය උත්පාදනය කරන ප්‍රභවයන්;

(iii) ජාතික විදුලිබල පද්ධතියට ඉහත එක් එක් ප්‍රභවයෙන් උත්පාදිත විදුලිය, ප්‍රතිශතයක් ලෙස;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2021 වර්ෂය වනවිට රජයේ මැදිහත්වීමෙන් උත්පාදනය කරන විදුලිය ප්‍රමාණය, 2025 වර්ෂය වනතෙක් ප්‍රමාණවත් වන්නේද;

(ii) නොඑසේ නම්, ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

482/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය දැඩි මූල්‍ය අර්බුදයකට ලක් වී තිබෙන බවත්;

(ii) ඒ හේතුවෙන් සේවක වැටුප් ගෙවීමට පවා දුෂ්කර වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මේ වනවිට සේවයේ නියුතු මුළු සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) එම සේවකයන්ට අඩ වැටුප් සමඟ මාස තුනක් නිවාඩු ලබා දීමට තීරණය කර තිබේද;

(iii) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මූල්‍යමය වශයෙන් ශක්තිමත් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

548/2020

ගරු චන්දිම වීරක්කොඩි මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ගාල්ල, බෙලිගහ හන්දියේ ඉදිකරමින් පවතින නව අධිකරණ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු මන්දගාමීව සිදුවන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම අධිකරණ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීමට අවශ්‍ය පියවර ගෙන තිබේද;

(ii) ඒ සඳහා ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන මේ වනවිට පවතින්නේද;

(iii) නොඑසේ නම්, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සපුරා ගන්නා මූලාශ්‍ර කවරේද;

(iv) එසේ මූල්‍ය ප්‍රතිපාදන සපුරාගත් පසු එහි වැඩකටයුතු කඩිනම් කිරීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*අ1.

විසර්ජන (2021) පනත් කෙටුම්පත — (දොළොස්වැනි වෙන් කළ දිනය) — කාරක සභාව.

(නොවැම්බර් 30 දින ප්‍රගතිය)

*2.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ නියෝග (අංක 1),— 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 49(1) වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 58 වගන්තිය යටතේ නිපුණ ඉදිකිරීම් වැඩකරුවන්, ඉදිකිරීම් වැඩබිම් අධීක්ෂකවරුන්, මධ්‍යම මට්ටමේ කාර්මික නිලධරයන් සහ ඉදිකිරීම් කර්මාන්තයේ නියුතු වෙනත් වෘත්තිකයන්ගේ නාමලේඛනය සම්බන්ධයෙන් නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2020 ජූනි 25 දිනැති අංක 2181/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2020.11.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*3.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ නියෝග (අංක 2),— 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 48(6) වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 58 වගන්තිය යටතේ ශිල්ප හැඳුනුම්පත් සම්බන්ධයෙන් නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2020 ජූනි 25 දිනැති අංක 2181/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2020.11.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*4.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ නියෝග (අංක 3),— 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 32(5) වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 58 වගන්තිය යටතේ සුදුසුකම්ලත් තැනැත්තන් සඳහා විනය ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2020 ජූනි 25 දිනැති අංක 2181/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2020.11.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*5.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ නියෝග (අංක 4),— 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 36(1) වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 58 වගන්තිය යටතේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් සඳහා වන විනය කාර්ය පටිපාටිය සඳහා මාර්ගෝපදේශ සම්බන්ධයෙන් නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2020 ජූනි 25 දිනැති අංක 2181/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2020.11.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*6.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ නියෝග (අංක 5),— 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 42 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 58 වගන්තිය යටතේ දේපළ සංවර්ධනකරුවන් ලියාපදිංචිකිරීම සම්බන්ධයෙන් නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2020 ජූනි 25 දිනැති අංක 2181/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2020.11.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*7.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ නියෝග,— 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 112 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2019 අප්‍රේල් 08 දිනැති අංක 2118/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2020.11.13 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

* 8.

සාප්පු හා කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය සහ වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

* 9.

ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

අවම වේතන (ඉන්දියානු කම්කරු) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

කර්මාන්තශාලා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## දිනට නියමිත කටයුතුවලට අදාළ සංශෝධන පිළිබඳ දැනුම්දීම

අ1.

විසර්ජන (2021) පනත් කෙටුම්පත නමැති පනත් කෙටුම්පතට කාරක සභාවේදී ඉදිරිපත් කරන සංශෝධන සඳහා වෙනම නිකුත් කළ "දිනට නියමිත කටයුතුවලට අදාළ අතිරේකය" නමැති පත්‍රිකාව බලන්න.

---